# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/45 - 2019 ඔක්තෝබර් මස 29 වැනි අඟහරුවාදා - 2019.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත

තැපෑලෙන් ඡන්දය දීම

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 23 වන වගන්තිය සහ එම පනතේ දෙවන උපලේඛනය අනුව තැපැල් ඡන්ද විමසීම් දින පහත දැක්වේ.

2019 ඔක්තෝබර් මස 31
2019 නොවැම්බර් මස 01
2019 නොවැම්බර් මස 04
2019 නොවැම්බර් මස 05
2019 නොවැම්බර් මස 07

02. එක් එක් මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරීන් විසින් 2019.10.15 දින සහතික කරන ලද තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුවේ සඳහන් සෑම සහතික කිරීමේ නිලධාරියෙකුගේ කාර්යාලයක්, ඒකකයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් වන විට;

තැපැල් ඡන්දදායකයන් ලෙස සලකනු ලබන නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ ඡන්දය ගැනීම අදහස් කරන ඉහත පළමු වන ඡේදයේ සඳහන් දිනය හෝ දින, ඡන්ද විමසීම් දිනය හෝ දින වන අතර;

මෙම තැපැල් ඡන්ද විමසීම සිදුකෙරෙන ස්ථානය ඡන්ද පොළක් වේ.

03. එබැවින් 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ V වන කොටසෙහි ඇතුළත් වැරදි, දූෂණ ක්‍රියා සහ නීතිවිරෝධී ක්‍රියා සහ මැතිවරණ කොමිෂන් සභාව ලබාදී ඇති විධාන, නියම හා මඟ පෙන්වීම්වලට යටත්ව තැපැල් ඡන්ද විමසීම සිදුකළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්.ජේ.අබේසේකර | එස්. රත්නජීවන් එච්.හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2019 ඔක්තෝබර් මස 29 වන දින,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

11 - 1099